**සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම - 2015**

**----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ (“සමාගම”) හා එහි හිමිකම් ගිණුම් ආයෝජක (“සමාගම හා ආයෝජක”) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල, ගෙවිය යුතු භාණ්ඩ බදු (excise duty) ලෙස රු.මිලියන 65.8 ක වගකීමක් ඇතුළත් වී තිබුණි. එහි පැවැත්මට අදාළව සැලකිය යුතු ප්‍රමාණයක අවිනිශ්චිතතාවයක් පවතින හෙයින් වගකීමක් ලෙස හඳුනාගැනීමේ පදනම ප්‍රශ්නගත වේ. මෙම මුදල 2010 වර්ෂයට පෙර ගනුදෙනුවලට අදාළවන අතර එවක සිට බදු බලධාරීන් සමඟ කිසිදු සන්නිවේදනයක් සමාගමට නොවූ අතර එය ගෙවීම සඳහා කිසිදු ඉල්ලීමක් ද නොවීය. වගකීමක් ලෙස මෙම මුදල හඳුනාගැනීමේ පදනම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාණයක අවිනිශ්චිතතාවයක් පවතින බැවින් සමාගමේ වගකීම් ප්‍රමාණය වැඩියෙන් දැක්විය හැක.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විකුණන සෑම එල්පී ගෑස් සිලින්ඩරයකටම සමාගම විසින් තැන්පතුවක් තබා ගනු ලැබේ. සිලින්ඩර් තැන්පතුව පිළිබඳ කොටස ආපසු ගෙවිය යුතු ලෙස සැලකෙන අතර අනෙක් සංරචකය ආපසු නොගෙවන ලෙස සැලකේ. සමාගමේ ප්‍රතිපත්තියට අනුව, ආපසු නොගෙවන තැන්පතුව කාලපරිච්ඡේදය සඳහා සිලින්ඩර් විකිණීමේ ආදායම ලෙස හඳුනාගනු ලබන අතර ආපසු ගෙවිය යුතු තැන්පතුව වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ. පසුගිය වර්ෂ තුනක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබූ මුළු ආපසු ගෙවිය යුතු තැන්පතු වගකීම, වර්ෂයෙන් වර්ෂය සැලකිය යුතු ලෙස වැඩි වී තිබූ අතර එය 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5,144 ක් විය. පසුගිය අත්දැකීම් පදනම් කරගෙන ගිවිසුම්ගත වගකීමක් පැවතියද, අපේක්ෂිත ගලායෑම මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් වගකීමේ ප්‍රමාණය නොවන බවට සාක්ෂි දරයි.

(ආ) 2010 වර්ෂයේ සිට ලැබිය යුතු වෙළඳ ශේෂයන් හා ගෙවිය යුතු වෙළඳ ශේෂයන් ලෙස පිළිවෙලින් රු.3,190,946 ක් හා රු.422,295 ක් හඳුනාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර, එම ශේෂයන් පෙර පරිපාලන සමාගමේ සම්බන්ධිත පාර්ශවයන් විය. සමාගම හා ඉහත අස්ථිත්වය අතර කිසිදු සන්නිවේදනයක් නොපවතින බැවින් මෙම මුදල් අයකර ගැනීම/ නිරවුල් කරගැනීම උගහටය.

(ඇ) 2014 දෙසැම්බර් සිට සහ 2010/2011 සිට නොවෙනස්ව පවතින පිළිවෙලින් රු.මිලියන 4.24 ක හා රු.521,324 ක ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

## 2.4 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

-----------------------------------

සමාගමේ ලියාපදිංචි කාර්යාල ගොඩනැගිල්ල එහි මව් සමාගම වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පීඑල්සී සමාගමට (SLIC) අයත් වේ. ඉහත පරිශ්‍රය උපයෝජනය කිරීම සඳහා සමාගම විසින් මාසික කුලියක් ගෙවනු ලැබේ. එම මව් සමාගම යටතේම ක්‍රියාත්මක වන සීමාසහිත කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමට එක් මහලක් සමාගම විසින් උප බදු දී තිබුණි. කෙසේ වුවද, සමාගම හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පීඑල්සී සමාගම අතර බදු ගිවිසුමක් නොතිබුණු අතර සමාගම හා සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම අතර උප බදු ගිවිසුමක්ද නොවීය.

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 5,342 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 5,434 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 92 ක පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් පිරිවැය රු.මිලියන 5,017 කින් අඩුවීම හා ආදායම රු.මිලියන 5,199 කින් අඩුවීම හා ඊට ප්‍රතිරූපීව මෙහෙයුම් වියදම රු.මිලියන 211 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

### 3.2.1 ලාභදායීත්වය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ආදායම**

----------

2015 වර්ෂය තුළදී ගෘහස්ථ එල්පී ගෑස් සිලින්ඩරයක මිල (කි.ග්‍රෑම් 12.5 සිලින්ඩරය) අවස්ථා තුනකදී අඩුකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ රු.මිලියන 29,084 ක ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ ආදායම රු.මිලියන 5,199 කින් හෙවත් සියයට 18 කින් අඩු වී තිබුණි.

**(ආ) විකුණුම් පිරිවැය**

---------------------

එල්පී ගෑස් ගිවිසුම්ගත මිල 2012 වර්ෂයේ සිට අඛණ්ඩව පහළට සංශෝධනය කර තිබූ අතර සාමාන්‍ය එල්පී ගෑස් වෙළඳපොළ මිල 2015 වර්ෂයේදී මෙට්‍රික් ටොන් එකක් එජඩො 431 ක් පමණ විය. 2014 වර්ෂයේදී එය එජඩො 805 ක් විය. පසුගිය වර්ෂ 6 සඳහා අඩුම එල්පී ගෑස් මිල වූ එජඩො 336 දක්වා එල්පී ගෑස් වෙළඳපොළ මිල 2015 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී පහළ වැටී තිබුණි. එබැවින් සමාගමේ විකුණුම් පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 5,017 කින් හෙවත් සියයට 21 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ මණ්ඩලයට අයත් ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගමට බදු දී තිබූ ඉඩමක කෙරවළපිටිය පිහිටි සමාගමේ නැවත පිරවීම් නිෂ්පාදන පිරියත (Refilling Production Plant) 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පැවතුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් සමාගම හා සීමාසහිත ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම අතර උප බදු ගිවිසුමක් නොතිබුණි. සමාගම විසින් සීමාසහිත ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමට උප බදු කුලී ගෙවීමක් නොකරන බව ද තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක වැලිපැන්න ඉන්ධන පිරවුම් හළක් ඉදිකරමින් සීමාසහිත කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට බදු දී තිබුණද මෙම ඉඩම උපයෝජනය සඳහා සීමාසහිත කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සමඟ බදු ගිවිසුමකට එළඹීමට සමාගමට නොහැකි වී තිබුණි. තවද මෙම දේපල උපයෝජනය සඳහා කුලියක් සමාගම විසින් දැනට ගෙවනු නොලැබේ.

(ඇ) 2013 ජුනි මාසය තුළදී එල්පී ගෑස් ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු (PAL) ලෙස රු.මිලියන 15.5 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද, නැව් බඩු තොගය අවලංගු කර තිබූ අතර පසුව මෙම මුදල ලැබිය යුතු මුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. එතෙක් සිට මෙම මුදල අය කර ගැනීම සඳහා සමාගමට නොහැකි වී තිබුණි.

(ඈ) වාර්තාකරණ දිනයට ලැබිය යුතු මුළු බහාලුම් (Containers) තැන්පතු රු.මිලියන 4.9 ක් වූ අතර ඉන් රු.මිලියන 4.55 ක මුදලක් 2006 සිට 2014 දක්වා කාල පරිච්ඡේදයට අදාළව විය. ගෙවන ලද බහාලුම් තැන්පතු ප්‍රමාදයකින් තොරව ආපසු ලබා ගැනීම තහවුරු කර ගැනීමට සමාගම විසින් පසු විපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 වෙළඳපොළ කොටස

එල්පී ගෑස් අංශය අඛණ්ඩව වර්ධනය වන අතර සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම වෙළඳපොළ නායකත්වයට පත් වී තිබුණි. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා වෙළඳපොළ සඳහා එල්පී ගෑස් අවශ්‍යතාවයෙන් සියයට 69 ක්ම සපයා තිබුණේ මෙම සමාගමයි. සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ විකුණුම් පරිමාව 2015 වර්ෂය තුළදී හා පෙර වර්ෂ 4 තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | | | ප්‍රමාණය මෙට්රික් ටොන් වලින් | | |
|---|---|---|---|---|---|
| සිලින්ඩර් වර්ගය | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
| කිලෝ ග්‍රෑම් 2.3 | 9,164 | 8,434 | 7,441 | 6,120 | 4,917 |
| කිලෝ ග්‍රෑම් 5 | 3,742 | 1,433 | 107 | - | - |
| කිලෝ ග්‍රෑම් 12.5 | 157,683 | 122,225 | 116,682 | 114,867 | 113,585 |
| කිලෝ ග්‍රෑම් 37.5 | 19,442 | 17,976 | 17,288 | 16,117 | 15,595 |
| තොග | 19,495 | 21,129 | 17,163 | 17,165 | 14,967 |
| එකතුව | 209,526 | 171,197 | 158,681 | 154,269 | 149,064 |

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | දිගුකාලීන ශේෂයන් අයකර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. |
| (ආ) | තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන ක්‍රම | කළමනාකරණ ලිපිය මඟින් පෙන්වා දෙන ලද, තොරතුරු තාක්ෂණ පද්ධතියේ දුර්වලතා නිවැරදි කළ යුතුය. |